# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 13/12/2024 පැය

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.12.12 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 59 | 1445 | තඹ දඟර 01<br>යකඩ බැරල් 07<br>ගෑස් සිලින්ඩර් 01<br>ගෑස් ලිප් 01<br>ප්ලාස්ටික් බූලි 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උතුරු පලාත් විශේෂ වැටලීම් ඒකකය.**

2024.12.12 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උතුරු පලාත් විශේෂ වැටලීම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මන්නාරම පොලිස් වසමේ මන්නාරම බස් නැවතුම්පොල ප්‍රදේශයේදී **මත්කරල් 200 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත භාර දී** ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වූ නාච්චිකුඩා ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර**

2024.12.12 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පුලියන්කුලම පොලිස් වසමේ සින්නපුවරසකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පුලියන්කුලම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 68 ක් වූ පුලියන්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පුලියන්කුලම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 04. කේරළ ගංජා සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර

2024.12.12 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මිගස්වැව පොලිස් වසමේ අක්බර්පුර වැටලීම් 03 ක් සිදුකර **කේරළ ගංජා ග්‍රෑම් 215 ක්, ග්‍රෑම් 260 ක් හා ග්‍රෑම්191 ක් ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට** ගෙන අරලගංවිල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 46, 49 හා 51 වයස්වල පසුවන මැදිරිගිරිය හා පොළොන්නරුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අරලගංවිල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුර

2024.12.12 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඌරගස්මංහන්දිය පොලිස් වසමේ දෙරණගහගොඩැල්ල ප්‍රදේශයේ වැටලීම් 02 ක් සිදුකර **හෙරොයින්** ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 200 ක් හා හෙරොයින් ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 500 ක් සමඟ සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන අහුංගල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් අවරුදු 27 හා 31 වයස් වල පසුවන ඌරගස්මංහන්දිය හා බෙන්තොට ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

අහුංගල්ල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**